# ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ හා ජෛන මහාවීර

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

**කහවනුගොඩ විමලධම්ම හිමි**

බුදුරජාණන් වහන්සේ ලොව පහළවීමට පළමු නොයෙක් ආගම් ඉන්දියාවේ පැවතුන බව ඉතිහාසය මගින් අනාවරණය වෙයි. නිගණ්ඨනාථපුත්ත, අජිත-කේසකම්බලී, පකුධකච්චායන, පූර්ණකස්සප, සඤ්ජය, බෙල්ලට්ඨපුත්ත යනුවෙන් ශාස්තෘවරු හය දෙනෙක් තත්කාලීන ඉන්දීය සමාජයෙහි නොයෙක් ආගමික මත පළ කරමින් විසූහ. මුඛ්‍ය වශයෙන් බලන විට ඔවුන්ගේ ඒ සෑම ආගමික කටයුත්තක්ම උච්ඡේද හා ශාස්වත යන දෘෂ්ටි දෙකට ඇතුළත් කළ හැකිය. මීට අමතරව අසිත හෙවත් කාලදේවල ආලාරකාලාම, උද්දකාරාම-පුත්ත වැනි තාපසවරු ද, උරුවෙල් කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප වැනි ජටිලයෝ ද (එකල) විසූහ.

එමෙන්ම බ්‍රාහ්මණ සමාජයේ බලපෑම ද මෙහිලා සඳහන් කළ යුතුය. බමුණෝ බොහෝ සෙයින්ම ආත්මාර්ථකාමී වූහ. සමාජය කොටස් කරන ඔවුහු අගතිගාමී වූහ. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යනුවෙන් සමාජය සිව් කොටසකට බෙදූහ. බ්‍රාහ්මණයෝ අනුශාසකයෝය. ක්ෂත්‍රියයෝ රාජ්‍ය පාලකයෝය. වෛශ්‍යයෝ කම්කරුවෝය. ශුද්‍රයෝ දැසි දස්සෝය. මේ ක්‍රමයෙන් එක් පක්ෂයකට සැප විඳීමටත්, එක් පක්ෂයකට දුක් විඳීමටත් සිදුවී තිබිණි. වනිතා පක්ෂයට ලැබී තිබුණ තැන ද බෙදජනකය. මෙවැනි සංකීර්ණ සමාජයක් පැවති වකවානුවක විසූ සියලුම ශාස්තෘවරුන් ගැන නොව ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ හා ජෛන මහාවීර යන දෙදෙනා අතර ඇති සම විෂමතාවලින් බිඳක් දැක්වීම මගේ උත්සාහයයි.

**වර්ධමාන මහාවීර :**

නිගණ්ඨනාථපුත්ත වූකලී ජෛනාගමේ ආදිකතෘභූත වූ වර්ධමාන මහාවීර යයි මෙකල බොහෝ විචාරකයෝ පිළිගනිති. ජෛන යනු 'දිනූ' යන අර්ථය ඇති 'ජින' යන්නෙන් බිඳී ආවක් බැව් පෙනේ. 'නිගණ්ඨ' යනු බැඳීමෙන් තොර යන අර්ථාන්විත වචනයකි. නිගණ්ඨයන්ගේ අන්තිම ශාස්තෘවරයා වර්ධමාන මහාවීරතුමාය. බුද්ධ ධර්මය ත්‍රිපිටකයෙහි සංග්‍රහ වී ඇත්තා සේ ජෛනයන්ගේ ධර්මය කල්ප සූත්‍රයෙහි සංග්‍රහ වී ඇත්තේය. මෙතුමා බුදුරජාණන් වහන්සේගේ සමකාලිකයෙකි. එහෙත් බුදුරජාණන් වහන්සේට වැඩිමහල් යයි ද, උසින් මහතින් වැඩි යයි ද විචාරකයෝ පිළිගනිති. මහාවීරතුමා අඩි එකොළහක් පමණ උස්වූ ශරීරයක් ඇතිව සිටි බැව් ද ඓතිහාසික ග්‍රන්ථයන්හි දැක්වේ. ජෛනාගමේ හැටියට මහාවීරට පළමුව මුණිවරයන් විසිතුන්දෙනෙකු සිටි බැව් කියති. මහාවීරතුමා වූකලී සූවිසිවන මුණිවරයාය. බුද්ධාගමේ හැටියට ද සූවිසි බුදු කෙනෙක් ලොව පහළ වූහ. අප ගෞතම සර්වඥයන් වහන්සේ විසිපස්වෙනියාය. මහාවීරතුමා විදේහ ජනපදයෙහි වෛසාලිය අසල කුණ්ඩ ග්‍රාමයෙහි ක්ෂත්‍රිය රාජ කුලයෙහි උපන්නෙකි. බුදුරජාණන් වහන්සේ මගධ දේශයෙහි කපිලවස්තු පුරයෙහි ශාක්‍ය රාජ වංශයෙහි උපන්හ. මහාවීරතුමාට පළමුව සිටි මහාතීර්ථංකරයන් විසිතුන්දෙනාගේ ඉතිහාසය කාලය නමැති අඳුරු පටලයෙන් වැසී ගොස් තිබෙන නමුත් විසිතුන්වෙනියා වූ පාර්ශ්වනාථ මුනිවරයා ඓතිහාසික පුද්ගලයෙකි. එතුමා වූකලී බරණැස් අශ්වසේන රජතුමාගේ ඖරස පුත්‍රරත්නයයි. පාර්ශ්වනාථයන්ගෙන් පසු අවුරුදු දෙසිය පනසක් ගතවනතුරු ජෛන තීර්ථංකරයෙක් ඇති නොවීය. එහෙත් අප බුදුරජාණන් වහන්සේට සමකාලීනව ජෛනයන්ගේ අන්තිම මුනිවරයා වූ මහාවීරතුමා පහළ විය.

**කේවල ඥානය :**

ක්ෂත්‍රිය වංශයෙහි උපන් සිද්ධාර්ථ නම් රජකෙනෙක් එතුමාගේ පියා විය. මෑණියෝ වූකලී ත්‍රිසලා නම් දේවිය වූහ. බුදුන්වහන්සේගේ සමකාලිකයෙකු වූ බිම්සර රජතුමාට මේ ලිච්ඡවි රජතුමාගේ දියණි කෙනෙකුන් සරණ පාවා දුන් බැව් ඉතිහාසයෙහි දැක්වේ. බෝසතුන්වහන්සේ ගිහිගෙය හැරපියා මහභිනිෂ්ක්‍රමණය කළේ විසිනව හැවිරිදි වියෙහිදීය. උන්වහන්සේ සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කළහ. මහාවීර තුමා ද තිස් හැවිරිදි වියේදී ගිහිගෙය හැර ගොස් දොළොස් අවුරුද්දක් දුෂ්කරක්‍රියා කොට 'කේවල ඥානය' ලැබ මෝක්ෂය අවබෝධ කළ බැව් කල්පසූත්‍රය කියයි. මින්පසු එතුමා තිස් අවුරුද්දක් මගධ, අංග, මිථිලා, කෝසල ආදී රාජ්‍යවල සැරිසරමින් ධර්මදේශනා කළ බැව් සඳහන් වේ. මහාවීරට මක්ඛලී-ගෝසාල හමුවුණේ මෙසේ ධර්මදේශනා කරන අවධියෙහිදීය. ගෝසාල කලක් මහාවීරතුමාගේ ශ්‍රාවකයෙකු වී එතුමා පයුරු පාසනය කළ නමුත් ඔහුගේ නිර්ලජ්ජී භාවය නිසා ඒ දෙදෙන සහ ඔවුන්ගේ ශ්‍රාවක ගණයා අතර ද මතභේද පැනපැගුණි. මක්ඛලී ගෝසාල වී යැයි කියති.

විදේහ, මගධ ආදී පෙදෙස් ඇතුළත් වර්තමාන බිහාරයෙහි බමුණු බලය අධිකව පැවති සමයක මේ ශාස්තෘන් දෙදෙනාගේම ඉපදීම විශේෂ ලක්ෂණයකි. බමුණෝ මෝක්ෂය තමන්ට පමණක් ලැබිය හැකි යයි කියා ගත්හ. බමුණු බලයට බුද්ධ ධර්මය මෙන්ම ජෛන

ධර්මය ද එකහෙළා විරුද්ධ වූහ. බමුණන්ට විරුද්ධව නැඟී සිටි වෙනත් නිකායෝ ද එකළ වූහ. ගෝසාල එබඳු නිකායක් ඇතිව සිටි කෙනෙකි. ආජීවක නවුස් පිරිස් පිරිවරා සිටි ඔහු නිර්ලජ්ජී ජීවිතයක් ගත කළ බැව් බෞද්ධ පොතපතෙහි සඳහන්ව තිබේ. මෝක්ෂය සෙවීමෙහි තද ආසාවෙන් පෙලුණු නානා විපරීත මතධාරීන් බහුල වූ ද, බමුණු බලය අධික වූ ද සමයක බුදුරජාණන් වහන්සේ සහ මහාවීර වැන්නවුන් පහළවීම පුදුමයක් නොවේ. බ්‍රාහ්මණ ආධිපත්‍යයට බුද්ධාගමෙන් මෙන්ම ජෛනාගමෙන් ද තරයේ පහර වැදුනේ ය.

**සමාන අසමානකම් :**

බුද්ධාගම සහ ජෛන ආගමත් අතර ඇතැම් සමාන ගුණයක් ඇතැයි සිතන විචාරකයන් ඇති නමුත් මේ ආගම් දෙක හැම පක්ෂයෙන්ම විරුද්ධ බැව් ඉර හඳ මෙන් ප්‍රකටය. ජෛනාගම සහ බුද්ධාගම අතර සමානත්වයක් පෙනෙන්නට තිබෙන්නේ පැවිදි ජීවිතය සම්බන්ධයෙනි. තව ද බමුණු ධර්මය කෙරෙහි ඇති විරුද්ධතාව නිසා ද කිසියම් සමානත්වයක් පෙනෙන්නට තිබෙන්නේ පැවිදි ජීවිතය සම්බන්ධයෙනි. තව ද බමුණු ධර්මය කෙරෙහි ඇති විරුද්ධතාවය නිසා ද, කර්මවාදය පිළිගැනීම නිසා ද කිසියම් සමානත්වයක් පෙනෙන්නට තිබෙන්නේ පැවිදි ජීවිතය සම්බන්ධයෙනි. තව ද බමුණු ධර්මය කෙරෙහි ඇති විරුද්ධතාවය නිසා ද, කර්මවාදය පිළිගැනීම නිසා ද කිසියම් සමනාත්වයක් පෙනෙන්නට තිබේ. එහෙත් ආත්මවාදය, ගැලවීමේ මාර්ගය, නිර්වාණාවබෝධය යන මේ කරුණු අතින් බුදුරජාණන් වහන්සේගේ හා මහාවීරගේත් ධර්මය අහසට පොළොව මෙන් විසදෘශ වෙයි. ක්‍රි: වර්ෂයාගේ ආරම්භය තෙක් ඇති ජෛනයන්ගේ ඉතිහාසයෙහි ඔවුන්ගේ ආගමික නායකයින්ගේ නම් ගම් විනා සැලකිය යුතු සිද්ධීන් ගැන සඳහන් නොවේ. භද්‍රබාහු එබඳු නායකයෙකි. භද්‍රබාහු කෙරෙහි පැහැදුන මෞර්ය වංශික චන්ද්‍රගුප්ත රජතුමා තම අවසාන කාලයෙහි ජෛනාගම වැළඳගෙන සිංහාසනයෙන් ඉවත්වූ බැව් ඉතිහාසයෙහි සඳහන් වෙයි. එහෙත් මේ මතය ඇතැම් විචාරකයෝ පිළිනොගනිති. මේ රාජයාගේ දෙමුණුබුරු වූ ද, අශෝක මහරජුගේ මුණුබුරු වූ ද සම්පති කුමරු ද එසේම ජෛන ආගම වැළඳගත් බැව් ඉතිහාසය කියති. මහාවීර උසස් රජ පෙළපතෙහි ජනිත වූ හෙයින් එතුමාට රාජ රාජ මහාමාත්‍යවරුන් ද, මහ ධන සිටුවරුන් ද තමා කෙරෙහි නතුකර ගත හැකි විය. බුදුරජාණන් වහන්සේ හා මහාවීරතුමාත් අතර සමානත්වයක් දක්වීම මෙහිලා අනපේක්ෂිතය. ඒ දෙදෙනා වහන්සේගේ ධර්මය අහසට පොළොව මෙන් වෙනස්වන බැවිනි. එසේ ද වුවත් මෙහි කිසියම් හැඳින්වීමක් කරනු ලැබේ.

**බුදුරජාණන් වහන්සේ** - නම: සිද්ධාර්ථ (පැවිදිවීමට පෙර). පියාගේ නම: සුද්ධෝදන. මෑණියන්ගේ නම: මහාමායාදේවි. උත්පත්ති ස්ථානය: කපිලවස්තුපුරය. වංශ පරම්පරාව: ශාක්‍ය වංශය. දේවිය: යසෝධරා. ඥානාවබෝධය කළ තැන: බුද්ධගයාව. පිරිනිවි තැන: කුසිනාරා නුවර.

**මහාවීරතුමා** - නම: වර්ධමාන (පැවිදිවීමට පෙර) පියාගේ නම: සිද්ධාර්ථ. මෑණියන්ගේ නම: ත්‍රිස්ලාදේවි. උත්පත්ති ස්ථානය: ක්ෂත්‍රියකුණ්ඩ ග්‍රාමය. වංශ පරම්පරාව: නාථ වංශය. දේවිය: යසෝධා. ඥානාවබෝධය කළ තැන: ඍජුවාලුකා ගංගාතලය. පිරිනිවි තැන: පාවානුවර.

තිස් හැවිරිදි වයසේ ගෘහාභිනිෂ්ක්‍රමණය කොට දොළොස් වසක් දුෂ්කරක්‍රියා කොට අන්තිමේ කේවල ඥානය ලැබගත් මහාවීරතුමා තමන් මහත් වීර්යයෙන් අවබෝධ කළ ධර්මය ලෝකානුකම්පාවෙන් දේශනා කිරීමටත්, ශ්‍රාවක සමූහයා ඇති කිරීමටත් අදිටන් කර ගත්තේ ය.